lk-gazette.lk-gaz

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය

කළමනාකරණ සහකාර තනතුරු ඇබෑර්තු - 2026 ඔක්තෝබර්

ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ පුරප්පාඩු වී ඇති කළමනාකරණ සහකාර තනතුරු සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් 2026.11.10 දින දක්වා අයදුම්පත් කැඳවනු ලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් ලෙස අයදුම් කළ හැක්කේ ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතු කාර්ය මණ්ඩලයට පමණි.

***2026.07.10** දින දිනමිණ හා තිනකරන් පුවත්පත්වල හා **2026.07.12** දින **Sunday Observer** පුවත්පතෙහි පළ කරන ලද දැන්වීමට අනුව **2026.08.10** දින හෝ ඊට පෙර මෙම තනතුරට අයදුම්පත් තැපැල් කරන ලද අයදුම්කරුවන් නැවත අයදුම්පත් ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ. (තව ද මුදල් ගෙවූ රිසිටිපත් ඉදිරිපත් නොකළ හා අසම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කළ අයදුම්කරුවන් හට නැවත සම්පූර්ණ කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ හැක.)**

1. <u>කළමනාකරණ සහකාර III ශ්‍රේණිය</u>

- **සුදුසුකම් :**

<u>බාහිර අපේක්ෂකයින් සඳහා</u>

1. අ.පො.ස. (සා/පෙළ) විභාගය එක් වරක දී පහත සඳහන් විෂයයන් සඳහා සම්මාන සාමර්ථ්‍යයන් සහිතව විෂයයන් හයකින් (06) සමත්ව තිබිය යුතුය.
   i. සිංහල භාෂාව/දෙමළ භාෂාව
   ii. ඉංග්‍රීසි භාෂාව/ඉංග්‍රීසි සාහිත්‍ය
   iii. ගණිතය

සහ

2. අ.පො.ස. (උසස් පෙළ) නව විෂය නිර්දේශය යටතේ සියලුම විෂයයන් (පොදු පරීක්ෂණය හැර) එකවර සමත් වීම. (අ.පො.ස. (උසස් පෙළ) පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් තුනකින් (03) එකවර සමත් වීම)

පහත සඳහන් සුදුසුකම් ඇති අය කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

අ). පිළිගත් ආයතනයකින් පරිගණක යෙදවුම් සම්බන්ධයෙන් මාස හයකට (06) නොඅඩු කාලසීමාවක් සඳහා ලබා ගන්නා ලද පිළිගත හැකි සුදුසුකමක් ලබා තිබීම.

සහ

ආ) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක පළපුරුද්ද ලබා තිබීම.

සටහන :

a. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
b. මනා චරිතයක් තිබිය යුතු ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk-gazette.lk

<u>අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා</u>

<u>(ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ කාර්ය මණ්ඩලය සඳහා පමණි)</u>

1. වාර දෙකකට (02) නොවැඩි වාර ගණනක දී අවම වශයෙන් සම්මාන දෙකක්වත් සහිතව අ.පො.ස. (සා.පෙළ) විභාගය විෂයයන් හයකට (06) නොඅඩු සංඛ්‍යාවකින් සමත් වී තිබිය යුතුය.

සහ

2. U-PL වැටුප් කේතය මගින් දක්වා ඇති වැටුප් පරිමාණයක් සහිත ප්‍රාථමික මට්ටමේ ස්ථිර තනතුරක් දැරීම සහ ප්‍රාථමික මට්ටමේ (U-PL) තනතුරක ස්ථිර කර තිබිය යුතුය.

සහ

3. අදාළ දිනට පෙර ප්‍රාථමික මට්ටමේ (U-PL වැටුප් කාණ්ඩයේ) ස්ථිර පත්වීමක අවම වශයෙන් වසර පහක (05) අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

- **වයස** : අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු අවුරුදු 30ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

- **තේරීම** : ලිඛිත පරීක්ෂණයක් සහ සම්මුඛ පරීක්ෂණයක් මගින් **(2026.11.21 හා 22 යන දිනයන්හි මෙම බඳවා ගැනීමට අදාළ ලිඛිත පරීක්ෂණ පැවැත්වීමට කටයුතු යොදා ඇත.)**

- **වැටුප් පරිමාණය :** UMN 1(III), - රු. 49,475-17×540 – 58,655 (මාසික)
  (මෙයට අමතරව විශ්වවිද්‍යාල පද්ධතියට අදාළ රජය විසින් අනුමත කරන ලද දීමනා ගෙවනු ලැබේ.)

වැඩි විස්තර සඳහා - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 06/2018 බලන්න.

<u>ව්‍යවස්ථාපිත ප්‍රතිලාභ</u>

- තනතුරට පත් කිරීමෙන් පසු අදාළ තනතුරට හිමි මාසික වැටුපෙන් සේවා දායකයාගෙන් 10% හා සේවා යෝජකයා විසින් 15% මුදලක් විශ්වවිද්‍යාලයීය අර්ථ සාධක අරමුදලට දායක කරනු ඇත. තවද සේවා යෝජකයා විසින් මාසික වැටුපෙන් 3% මුදලක් සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදලට දායක කරනු ඇත.

- පාරිතෝෂික දීමනාව

<u>අනෙකුත් ප්‍රතිලාභ</u>

- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාර ව හිමි අනෙකුත් දීමනා
- විශ්වවිද්‍යාලයේ වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට දායක කරගනු ඇත.

lk-gazette.lk-gaz

<u>අයදුම් කළ යුතු ආකාරය:</u>

අයදුම්කරුවන්ට තනතුරට අදාළ සුදුසුකම් දක්වා ඇති තොරතුරු පත්‍රිකා සහ අයදුම්පත් විශ්වවිද්‍යාලයීය වෙබ් අඩවියෙන් (www.bpu.ac.lk) බාගත (download) කළ හැකි ය.

සෑම අයදුම්කරුවෙකුම ආපසු නොගෙවන පදනම මත රු. 1000.00 ක අයදුම්පත් ගාස්තුවක් ගෙවිය යුතුය. මෙම මුදල් ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ ලංකා බැංකුවේ හෝමාගම ශාඛාවේ අංක 711201 දරන ගිණුමට බැර කළ යුතු ය. මුදල් තැන්පත් කළ රිසිට් පත අයදුම්පත සමඟ අමුණා එවිය යුතු ය. අපේක්ෂකයා සතුව රිසිට්පතේ පිටපතක් තබා ගැනීම යෝග්‍ය වේ. **අදාළ රිසිට්පත අමුණා නොමැති අයදුම්පත් සලකා බලනු නොලැබේ.**

නිසි ලෙස සම්පූර්ණ කරන ලද අයදුම්පත් සමඟ සුදුසුකම් දැක්වෙන අදාළ සහතිකවල හා පළපුරුද්ද ඇතුළත් සහතිකවල සහතික කළ ඡායා පිටපත් ද සහිත ව ලිපි කවරයක බහා එහි ඉහළ වම් කෙළවරෙහි තමන් විසින් අයදුම් කරනු ලබන තනතුර පැහැදිලි ව සඳහන් කර 2026.11.10 දින හෝ ඊට පෙර, **"නියෝජ්‍ය ලේඛකාධිකාරී (පාලන), ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, නො. 37, මොරගහහේන පාර, පිටිපන නගරය, හෝමාගම."** යන ලිපිනය වෙත **ලියාපදිංචි තැපෑලෙන්** එවිය යුතු ය. ලියාපදිංචි තැපැල් කුවින්තාන්සියේ පිටපතක් ලිපි කවරයේ අමුණා එවිය යුතු ය.

රජයේ දෙපාර්තමේන්තු / සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල/ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතනවල සේවා නියුක්තිකයන් විසින් එවනු ලබන අයදුම්පත් තම ආයතන ප්‍රධානියා මගින් එවීමට කටයුතු කළ යුතු ය.

ඉහත සඳහන් කළ අවශ්‍යතාවන්ට අනුගත නොවූ, අසම්පූර්ණ, අපැහැදිලි හෝ පමා වී ලැබෙන අයදුම්පත් කිසිදු දැනුම්දීමකින් තොර ව ප්‍රතික්ෂේප කරනු ලැබේ. සුදුසුකම් ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

ලේඛකාධිකාරී,
ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය,
නො. 37, මොරගහහේන පාර,
පිටිපන නගරය,
හෝමාගම.
2026.10.29

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED